ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-09-20 |

පැමිණිලිකරු : කේ.බී.ජයවර්ධන මයා,
අංක 01, පානියන්කඩවල,
අනුරාධපුර.

වගඋත්තර පාර්ශවය : 01. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය.

02. නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය,
අනුරාධපුර.

<u>පැමිණිලි අංකය :- ***HRC/AP/631/2014(S)***</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා 1975 සිට 2004 වර්ෂය දක්වා ගබඩා භාරකරුවෙකු වශයෙන් සේවය කරන ලද බවත්, 2004 වර්ෂයේ සිට විශ්‍රාම ගිය දිනය වන 2013.01.28 දින දක්වාම කළමනාකාර සහකාර තනතුර දරමින් ගබඩාව භාරව කටයුතු කළ බවත්ය.

පැමිණිලිකරු විශ්‍රාම යන 2014.01.28 දිනට හෝ එදිනට පෙර පැමිණිලිකරු භාරයේ තිබූ භාණ්ඩ ද්‍රව්‍ය භාරදීමට නිසි පිළිවෙළක් සකස් කර නොතිබූ බවත්, එමෙන්ම භාණ්ඩ භාර ගැනීමට පත්කළ දෙදෙනා වෙනත් රාජකාරී කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දී සති ගණන් භාණ්ඩ භාර නොගෙන සිටි බවත් දක්වා ඇත.

එමෙන්ම විශ්‍රාම යාමෙන් පසු මාස 09 ක්ම වැටුපක් හෝ දීමනාවක් නොලබා භාරදීමේ කටයුතු කර ගෙන ගිය බවත්, මෙතෙක් පැමිණිලිකරුට විශ්‍රාම වැටුප ලබා දීමට වගඋත්තරකරුවන් කටයුතු නොකිරීමෙන් තම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් පැමිණිල්ලෙන් වැඩිදුරටත් දන්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone — 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary — 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

2014.11.27 දිනැති වාර්තාව කොමිසම වෙත යොමු කරමින් වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය) දන්වා ඇත්තේ, පැමිණිලිකරු භාරයේ තිබූ භාණ්ඩ නිසි පරිදි භාරදීමට පැමිණිලිකරුට ප්‍රමාණවත් කාලයක් හා සේවක පහසුකම් සපයා දී තිබූ නමුත්, පැමිණිලිකරු එකී පහසුකම් උපයෝගී කර ගනිමින් තම කාර්ය ඉටුකර නොදුන් බවය.

කෙසේ වෙතත් ආයතනය තුළම නිලධාරීන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත් කර පැමිණිලිකරුගේ සහභාගීත්වය ඇතිව නැවත ගබඩාව විවෘත කර එහි ඇති භාණ්ඩ ලැයිස්තු ගත කර සම්පූර්ණ ඌණතා හා අතිරික්ත ලේඛන සකස් කිරීමට කටයුතු කරනු ලබන බවද දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය සහ නිරීක්ෂණ :-**

පැමිණිලිකරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරුවෙකුව සිට 2013.01.25 දින විශ්‍රාම ලබා ගෙන ඇත.පැමිණිලිකරුහට මෙතෙක් විශ්‍රාම ගැන්වීමේ ලිපියක් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නැත.

පැමිණිලිකරු විශ්‍රාම යාමට පෙර/විශ්‍රාම පූර්ව නිවාඩු ගැනීමට පෙර ගබඩා භාරදීම සඳහා 2011.11.17 , 2012.12.21 හා 2012.04.02 දින ඉල්ලීමක් කර ඇති නමුත් එම ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිචාර ලැබී ඇත්තේ පැමිණිලිකරු විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට ඉතාම ආසන්න කාලයකදී බවද නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරු විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගන්නා දිනට ඔහු භාරයේ ඇති භාණ්ඩ භාරදීමේ හැකියාව තිබී නොමැත.

පැමිණිලිකරු විශ්‍රාම යෑමට පෙර 2013.10.04 දිනැති භාණ්ඩ භාරදීමේ අපහසුතාවය පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය) විසින් පැමිණිලිකරුව දැනුවත් කර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විශ්‍රාම ගැනීමෙන් අවුරුදු දෙකකට පසු පැමිණිලිකරුගෙන් භාණ්ඩ භාර ගැනීම සිදුව ඇති බවද එම භාණ්ඩ භාර ගැනීමද නිසි පරිදි අවසන් කර නොමැති බවද නිරීක්ෂණය වේ.

නමුත් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුගේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් අදාළ භාණ්ඩ නියමිත දිනට භාර ගැනීමට නොහැකි වූ බවය.

කෙසේ වෙතත් මේ වන තෙක් පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප ලබාදීමට වගඋත්තරකරුවන් කඩිනම් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මේ අනුව, පැමිණිලිකරු 2013.01.28 දින විශ්‍රාම ගොස් මේ වන විට වසර 06 කට ආසන්න කාලයක් ගතව ඇති නමුත්, පැමිණිලිකරුගේ විශ්රාම වැටුප ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, මාස තුනක කාලයක් ඇතුළත අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කොට පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප සම්බන්ධ කටයුතු කිරීමට පියවර ගත යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 10 . 26 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01 අමාත්‍යතුමා,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය, අනුරාධපුර. B/